" අභිධර්මාර්ථසංග්‍රහ සන්නය" විමර්ශන පූර්වක

සංශෝධන සහිත සංස්කරණය

පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ

දර්ශනසූරි උපාධිය සඳහා

ඉදිරිපත් කරන ලද නිබන්ධය

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි

1990

440653

සංක්ෂිප්තය

මෙම නිබන්ධයේ කොටස් දෙකකි. එහි පළමු ව සංඥාපනයත් දෙවනු ව අභිධර්මාර්ථසංග්‍රහ සන්නයේ සංස්කරණයත් ඇත.

සංඥාපනයේ පරිච්ඡේද පහකි. ප්‍රථම පරිච්ඡේදයේ ඇතුළත් වන්නේ මෙහි දී භාවිත කරන ලද අභිධර්මාර්ථසංග්‍රහ සන්නය පුස්කොළ අත්පිටපත් 34 පිළිබඳ විස්තරය යි. ඒවා ලබා ගත් ස්ථාන, අත්පිටපත්වල දිග, පළල හා ප්‍රමාණ දැක්වීමත් එක් එක් ගුරු ශිෂ්‍ය පරම්පරාවලට අයත් අත්පිටපත් වර්ග කර දැක්වීමත් මෙහි දී කෙළෙමි.

සූත්‍ර, විනය හා අභිධර්ම ඛණ්ඩයෙන් භාවිත කරන බුද්ධ දේශනාවෙහි "ධම්ම" හා "අභිධම්ම" යන වචන දෙක යෙදා ඇති ආකාරය පැහැදිලි කිරීමත් "ධම්ම" යන වචනයට වඩා විශේෂාර්ථ සහිත ව "අභිධම්ම" යන වචනය යෙදී ඇති බව පැහැදිලි කිරීමත් දෙවන පරිච්ඡේදයෙන් කෙරේ.

තුන්වන පරිච්ඡේදයේ ඇතුළත් වන්නේ ථෙරවාදීන් විසින් අභිධර්මය ඉගෙනීමට වැඩි රුචියක් දැක්වීමට හේතු පිළිබඳ විග්‍රහයකි.

ථෙරවාදීන්ගේ අභිධර්ම ග්‍රන්ථ පිළිබඳ විස්තර කෙරෙන්නේ හතරවන පරිච්ඡේදයේ දී ය. මෙහි දී ධම්මසඞ්ගණී, විභඞ්ග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, යමක, පට්ඨාන හා කථාවත්ථු යන සප්තප්‍රකරණ, අටුවා, සංග්‍රහ, ටීකා, සන්න යන ග්‍රන්ථ ගැන විස්තර දැක්වේ. සප්තප්‍රකරණවලට අට්ඨකථා ලියනලද්දේ බුද්ධඝෝෂාචාර්යයන් විසිනි. ඒවා මෙසේ ය. අත්ථසාලිනී නම් ධම්මසඞ්ගණී අට්ඨකථාවත් සම්මෝහවිනෝදනී නම් විභඞ්ගට්ඨකථාවත් සෙසු පකරණ පහට පරමත්ථදීපනී නම් පඤ්චප්පකරණට්ඨකථාවත් ය. සප්තප්‍රකරණ හා අට්ඨකථා ආශ්‍රයෙන් සංග්‍රහ ග්‍රන්ථ ලියා ඇත. ඒවා අතර බුද්ධදත්ත හිමියන්ගේ අභිධම්මාවතාරය හා රූපාරූපවිභාගයත් අනුරුද්ධ හිමියන්ගේ නාමරූප පරිච්ඡේදය, පරමත්ථවිනිච්ඡය, හා අභිධම්මත්ථසංගහ ප්‍රධාන වෙයි. මේවාට සපයන ලද ටීකා ග්‍රන්ථවලින් මහාධම්මපාල හිමියන්ගේ පරමත්ථප්පකාසිනී, ආනන්ද වනරතන හිමියන්ගේ අත්ථසාලිනී, සුමංගල හිමියන්ගේ අභිධම්මත්ථසංගහ පුරාණටීකා, පරමත්ථ විනිච්ඡය, සච්චසංඛෙප, අභිධම්මත්ථවිකාසිනී හා අභිධම්මත්ථසංගහ විභාවිනී ටීකා, වාචිස්සර හිමියන්ගේ අභිධම්මාවතාර පුරාණටීකා හා නාමරූප

පරිච්ඡේද පුරාණටීකා, බුරුමරට සාරධජ හිමියන්ගේ පරමත්ථදීපනී, ඡපට හිමියන්ගේ සංඛෙපපද වණ්ණනා හා බදිරතිත්ථ ධම්මපාල හිමියන්ගේ අභිධම්මත්ථසංගහ අනුටීකාව, චෝලිය කස්සප හිමියන්ගේ මොහ විච්ඡේදනී යන අනුටීකා ගැනත් දිඹුලාගල කාශ්‍යප හිමියන්ගේ අභිධම්මත්ථසංගහ පුරාණ සන්නය, විල්ගම්මුල ධාඨනාග හිමියන්ගේ අභිධම්මාවතාර භාවසන්නය හා විජම්විතාර භාවසන්නය ඇතුළු සන්න, ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ පිළිබඳවත් විස්තර ඉදිරිපත් කෙළෙමි.

පස්වන පරිච්ඡේදයේ ඇතුළත් වන්නේ ටීකාචාර්ය සාරිපුත්ත හිමියන්ගේ අභිධර්මාර්ථසංගහ සන්නයේ කර්තෘ, කාලය, නාමය, නිමිත්ත, ප්‍රමාණ, ප්‍රයෝජන, භාෂාව හා රචනා ශෛලිය පිළිබඳ විස්තරයකි.

මෙම නිබන්ධයේ දෙවන කොටස අභිධර්මාර්ථසංග්‍රහ සන්න සංස්කරණය යි.

පොළොන්නරු යුගයේ වැඩ සිටි ටීකාචාර්ය සාරිපුත්ත හිමියන් විසින් රචිත අභිධර්මාර්ථසංග්‍රහ සන්නය සංස්කරණය කිරීමේ දී මූලික මූලාශ්‍ර වශයෙන් පුස්කොළ අත්පිටපත් 34ක් හා මුද්‍රිත පිටපත් 4 ක් භාවිත කෙළෙමි. එයිනුත් අනුරාධපුර ධර්මවර්ධනාරාමය, මාතර පමුරණ වාලුකාරාමය, ගාල්ලේ වැලිවත්තේ විජයානන්ද පිරිවෙන, ගාල්ලේ තල්පේ මීරිපැන්න අරියාකර විහාරය, අහංගම එළුකැටිය බිම්බාරාමය, අකුරැස්ස ගොඩපිටියේ ශ්‍රී සුදර්ශනාරාමය, උඩුගම්පොළ දොම්බවෙල ධර්මගුප්ත පිරිවෙන යන විහාරස්ථාන වලින් ලබාගත් අත්පිටපත් ප්‍රධාන කොට තබා ගතිමි. එසේ සැලකීමට හේතු වූයේ එම අත්පිටපත් එක් එක් ගුරු ශිෂ්‍ය පරම්පරාවලට අයත් වීමත් එම පිටපත්වලින් තවත් අත්පිටපත් ගණනක් පිටපත් කර තිබීමත් ය. ඒ පිළිබඳ විස්තර පුස්කොළ අත්පිටපත් වර්ගී කරණයේ දී දක්වමි.

පුස්කොළ අත්පිටපත් ඇසුරින් අභිධර්මාර්ථසංග්‍රහ සන්නයේ පෙළ සංස්කරණය කිරීමේ දී මුද්‍රිත පිටපත්වල දුර්වලතා ද සකස් කර ගත හැකි විය. උදාහරණ වශයෙන් මුද්‍රිත පිටපත්හි සඳහන් "මෙරමා හා සාධාරණභාවය නොමැත්තාහට ද ඒ ඒ ක්‍රියායෙහි ප්‍රතිහනන වශයෙන් ගැටෙමින් පවත්නා ......" යනාදී ඡේදයේ කොටසක් අඩු බව පුස්කොළ අත්පිටපත්වල දැක්වෙන "මෙරමා හා සාධාරණභාවය නොකැමැත්තාහට ද කෘතාකෘත දුෂ්චරිත සුචරිතයෙන් අනුශෝචනය කරන්නාහට ද ඒ ඒ ක්‍රියායෙහි ප්‍රතිහනන වශයෙන් ගැටෙමින් පවත්නා ....[1]" ඡේදය

---

1. අභිසස. 82 පිටුව අධෝ. 3

සැසඳීමෙන් පැහැදිලි වේ. එසේ ම "ඔවුන්ගේ සන්නිහිතාසන්නිහිතයට කාරණ කිම් ද?" යන්න මුද්‍රිත පිටපත්වල "ඔවුන්ගේ කාරණ කිම් ද?"[1] යි සඳහන් වීමත් වචන අඩුවීමකි.

එසේ ම "මොදනා"[2] යන්න "මෙදනා" යැ යි ද "විනාශය"[3] යන්න "අවිනාශය" යැ යි ද මුද්‍රණ පිටපත්වල සඳහන් වීම අර්ථ වෙනස් වීමටත් හේතු වී ඇත. එවැනි වැරදි තැන් නිවැරදි කිරීමට පුස්කොළ අත්පිටපත් බොහෝ සෙයින් ප්‍රයෝජනවත් විය.

මෙසේ පුස්කොළ අත්පිටපත් හා මුද්‍රිත පිටපත් ඇසුරින් වඩාත් නිවැරදි යැයි සිතිය හැකි මූලික පෙළත් ඒ ඒ අත්පිටපත්වල පාඨාන්තරත් දෙවන කොටසෙහි අන්තර්ගත වේ.

---

1. අභිසස. 18 පිටුව අධෝ. 9
2. එම 108 පිටුව අධෝ. 9
3. එම 164 පිටුව අධෝ. 1